# මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩු වී පවතින "සංවර්ධන නිලධාරී" තනතුරු සඳහා රාජ්‍ය සේවයේ නියුක්ත සුදුසුකම් සහිත උපාධිධාරී/උපාධිධාරී අභ්‍යාසලාභී නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මැතිවරණ කොමිෂන් සභාවේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පුරප්පාඩු වී පවතින **"සංවර්ධන නිලධාරී"** තනතුරු 24 ක් සඳහා සුදුසු නිලධරයන් අනුයුක්ත කරවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති, දැනට සංවර්ධන නිලධාරී සේවාව යටතේ පත්වීම් ලබා ඇති උපාධිධාරීන්ගෙන් / උපාධිධාරී අභ්‍යාසලාභීන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. යෝග්‍යතා :**

**1.1 සාමාන්‍ය සුදුසුකම්**

I. යහපත් චරිතයකින් හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.

II. සංවර්ධන නිලධාරී සේවාව යටතේ දැනටමත් රාජ්‍ය සේවයේ පත්වීම් ලබා ඇති උපාධිධාරී / උපාධිධාරී අභ්‍යාසලාභියෙකු විය යුතුයි.

**1.2 අධ්‍යාපන සුදුසුකම්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණිතය, තොරතුරු තාක්ෂණය, නීතිය හෝ හිණුම්කරණය පිළිබඳ උපාධියක් හදාරා තිබීම හෝ ගණිතය, තොරතුරු තාක්ෂණය, තර්ක ශාස්ත්‍රය හෝ ගිණුම්කරණය විෂයයක් ලෙස හදාරා ලබාගන්නා ලද උපාධියක් තිබීම.

II. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද, පරිගණක දත්ත පද්ධති කළමනාකරණය පිළිබඳව හැකියාව. ගිණුම්කරණ කටයුතු පිළිබඳව වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද, විමර්ශන කටයුතු පිළිබඳ පළපුරුද්ද හා සිංහල හා දෙමළ භාෂා දෙකම පිළිබඳ ප්‍රවීණතාව විශේෂ සුදුසුකම් ලෙස සැලකේ.

**02.** මැතිවරණ කොමිසන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඡන්ද විමසීම් කාලසීමා තුළදී සතියේ දිනවල කාර්යාල වේලාවෙන් බැහැරව බොහෝ වේලාවක් ද සති අන්ත හා රජයේ නිවාඩු දිනවල ද අවම වශයෙන් පැය දොළහක්වත් සේවය කිරීම අනිවාර්ය වන අතර, සෙසු කාල සීමාව තුළදී පවා කාර්යාල වේලාවෙන් බැහැරව සතියේ දිනවල හා සති අන්ත නිවාඩු දින වල සේවය කිරීමට සිදු වේ. තෝරාගන්නා නිලධාරීන්ට ස්වකීය පදිංචි ස්ථානයට ආසන්න සේවා ස්ථාන හිමිවීමේ සම්භාවිතාව බෙහෙවින් අඩු අතර, ඉතා කෙටි දැනුම්දීම් මත ස්වකීය නිත්‍ය සේවා ස්ථානයෙන් බැහැර සේවා ස්ථාන වලට තාවකාලිකව අනුයුක්තව සේවය කිරීමට ද සිදුවනු ඇත.

**03.** මෙම නිවේදනයේ අවසානයේ පළකර ඇති අයදුම්පතට අනුකූලව ස්වකීය අයදුම්පත් පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කර ගත් අයදුම්පත් සිය දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මගින් 2016 මැයි මස 10 දින හෝ ඊට පෙර ලැබෙන සේ **ලේකම්, මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය, තැ.පෙ. අංක. 02, සරණ මාවත, රාජගිරිය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"මැතිවරණ කොමිෂන් සභාවේ සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයදුම්පත්‍රය"** යනුවෙන් සඳහන් කළ යුතුය.

**04.** සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුන් තෝරාගන්නා අතර, එසේ තෝරා ගත් අයදුම්කරුවන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් මගින් මෙම කොමිෂන් සභාවට ස්ථාන මාරු කර ගැනීමට / අනුයුක්ත කරගැනීමට කටයුතු කරනු ලැබේ.

**05.** අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව තීරණය ද යම් විශේෂ හේතුවක් මත සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට සිදු වුවහොත් ඒ පිළිබඳව අවසාන තීරණය ද පුරප්පාඩු වලින් කොටසක් හෝ මුළුමනින් පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ද මැතිවරණ කොමිෂන් සභාව සතු වේ.

* සටහන - වැඩි විස්තර සහ පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වන්නේ නම් 011 - 2868441 දුරකථන අංකයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී ඇමතීම යෙහෙකි.

**ජේ.මු.සි.දී. හේරත්,**
**ලේකම්,**
**මැතිවරණ කොමිෂන් සභාව**
**මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය,**
**තැ.පෙ. අංක. 02. සරණ මාවත, රාජගිරිය.**
**2016.04.28**

## මැතිවරණ කොමිෂන් සභාව

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයදුම්පත

1 1.1 සම්පූර්ණ නම :

1.2 මුලකුරු සමග නම :

2. පදිංචි ලිපිනය :

3. දුරකථන අංකය :

3.1 කාර්යාලය
ජංගම

3.2 විද්‍යුත් තැපැල් ලිපිනය :

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. 5.1 උපන් දිනය : දිනය මාසය වර්ෂය

5.2 වයස අවු : මාස :
(අයදුම්පත් කැඳවීම අවසන් වන දිනට)

5.3 ස්ත්‍රී / පුරුෂ භාවය 0 - පුරුෂ 1 - ස්ත්‍රී
(අංකය සඳහන් කරන්න)

5.4 විවාහක / අවිවාහක බව 1 - අවිවාහක 2 - විවාහක
(අංකය සඳහන් කරන්න)

6. උසස් අධ්‍යාපන සුදුසුකම්

6.1 උපාධිය

වර්ෂය :

පන්තිය : 1 - පළමු පෙළ 2 - දෙවන පෙළ (ඉහළ) 3 - දෙවන පෙළ (පහළ) 4 - සාමාන්‍ය

(අංකය සඳහන් කරන්න)

විශ්වවිද්‍යාලය / උසස් අධ්‍යාපන ආයතනය

6.2 වෙනත් සුදුසුකම්

| පාඨමාලාවේ නම | ආයතනය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

7. වෘත්තීය සුදුසුකම් / සේවා වාර්තා

| තනතුර | ආයතනයේ නම හා ලිපිනය | කාල සීමාව | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8. පුහුණුවීම්

| පාඨමාලාවේ නම | ආයතනය | කාලසීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

9. 9.1 භාෂා ප්‍රවීණතාව

| | කියවීම | ලිවීම | කථනය |
|---|---|---|---|
| සිංහල | | | |
| දෙමළ | | | |
| ඉංග්‍රීසි | | | |

(අංකය සඳහන් කරන්න)

1 - ඉතා හොඳයි 2 - හොඳයි 3 - සාමාන්‍යයි 4 - දුර්වලයි

10. 10.1 සංවර්ධන නිලධාරී සේවාව යටතේ පත්වීම් ලැබූ දිනය : ..............................

10.2 දැනට රැකියාවේ නියුතු ස්ථානය : ..............................

10.3 පැවරී තිබෙන රාජකාරි : ..............................

11. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරන අතර, යම් හෙයකින් මෙහි සඳහන් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මාගේ අයදුම්පත අවලංගු කිරීමට එකඟ වන බවත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව දැනගත හොත් කිසිදු වන්දියක් නොලබා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් දනිමි.

......................  ..................

දිනය  අයදුම්කරුගේ අත්සන

12. ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මැතිවරණ කොමිෂන් සභාවේ .................................. තනතුර සඳහා ඉල්ලුම් කර තිබෙන මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ සේවයේ නියුතු .................................. මයා / මිය / මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................... තනතුරේ සේවය කරන බවත්, ඔහුගේ / ඇයගේ වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක බව ද, මෙම සේවා කාලය තුළ කිසිදු විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව ද, ඉහතින් සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද, මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද, සහතික කරමි. ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගත හොත් සේවයෙන් නිදහස් කළ හැකිය / නොහැකිය.

..............................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම : ..............................

තනතුර : ..............................

දිනය : ..............................

(නිල මුද්‍රාව) : ..............................